# 2.3 පෞද්ගලික ආධාරක පංති පාසැල් සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි කරන බලපෑම (ගාල්ල ප්‍රදේශය ඇසුරින්)

එච්.ජී. දයා සිසිර විජය බණ්ඩාර
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSRACT

ශ්‍රී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් අනතුරුව සමාජයේ සෑම ක්ෂෙත්‍රයක් තුළම පෞද්ගලික අංශයේ මැදිහත්වීම වර්ධනය විය. මේ අනුව අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ ද පෞද්ගලික අංශයේ මැදිහත්වීම වර්ධනය විය. මේ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය පුළුල් වී තිබේ. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වුවත් ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යපනය දක්වාම ශිෂ්‍ය, ශිෂ්‍යාවන් පෞද්ගලික ආධාරක පංති කෙරෙහි වැඩි නැඹුරුතාවක් පෙන්නුම් කරයි. එම හේතුව නිසා අධ්‍යාපනය කෙරෙහි පෞද්ගලික ආධාරක පංති සිදු කරන බලපෑම පිළිබඳව විමර්ශනය කාලීනව වැදගත්වේ.

පර්යේෂණයේ අරමුණු ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැකිය. එනම්,

1. පෞද්ගලික ආධාරක පංති උදෙසා පාසැල් ළමුන් යොමු වීම සඳහා බලපාන හේතු සාධක විමසා බැලීම.

2. පෞද්ගලික ආධාරක පංති පාසැල් සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි ලබා දී තිබෙන දායකත්වය පරීක්ෂා කිරීම.

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත පදනම් විය. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් තොරතුරු ලබා ගනු ලැබීය. එහි දී උසස් පෙළ හදාරණ ශිෂ්‍ය, ශිෂ්‍යාවන් 300 දෙදෙනෙකුගෙන් යුක්ත නියැදියක් තෝරාගත් අතර එම නියැදිය කලා, වාණිජ හා විද්‍යා යන සියලුම විෂය ක්ෂේත්‍ර ඇතුලත් වන ආකාරයට බෙදීමකට ලක් කර තොරතුරු ලබා ගනු ලැබීය. ද්විතියික දත්ත ලබා ගැනීමේ දී පර්යේෂණයට අදාළව ලියවී තිබෙන පොත් පත්, පර්යේෂණ වාර්තා, පුවත්පත් ලිපි, ප්‍රකාශන, සඟරා, අන්තර් ජාලය වැනි මූලාශ්‍ර පරිශීලනය කරන ලදී.

මෙහිදී එළඹුණු මූලික නිගමන වන්නේ පාසල් අධ්‍යපානය හදාරණ ශිෂ්‍ය, ශිෂ්‍යාවන් පෞද්ගලික ආධාරක පංති තුළින් ලබා ගන්නා වූ අධ්‍යාපනය ඔවුන්ගේ අධ්‍යාපන තත්වය වැඩි දියුණු කිරීම උදෙසා ඍජු බලපෑමක් සිදු කර තිබෙන බවයි. අධ්‍යාබන ක්ෂේත්‍රය තුළ නිර්මාණය වී තිබෙන තරඟකාරිත්වයට මුහුණදීමේ දී විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් පෞද්ගලික ආධාරක පංති සඳහා ශිෂ්‍ය, ශිෂ්‍යාවන් යොමුවී ඇති බවද පැහැදිලි විය.